*සැ. යු.* - 2014.06.27 වැනි දින පළ වූ අංක 1869 දරන *ගැසට් පත්‍රයේ* II සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,870 - 2014 ජූලි මස 04 වැනි සිකුරාදා - 2014.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 528 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 530 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජූලි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

527 – B 080853—300 (2014/07)

# රජයේ නිවේදන

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

2002 අංක 17 දරන මැනුම් පනත

**27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කිරීම**

2002 අංක 17 දරන මැනුම් පනතේ 27(අ) වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින් පත් කරමින් 2014.04.17 දිනැති අංක 1859 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදන පහත සඳහන් ලෙස 2014.05.30 දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කරමි.

*(අ) නිලබලයෙන් සාමාජිකයින් වන තැනැත්තන් ඃ*

| | | |
|---|---|---|
| i. පතික් මුදියන්සෙලාගේ පාලිත උදයකාන්ත මයා සර්වේයර් ජනරාල් - | සභාපති | සර්වේයර් ජනරාල් ධූරයේ රැඳී සිටින කාලය දක්වා |
| ii. සංගක්කාර මුදියන්සේලාගේ ප්‍රියන්ත පද්ම කුමාර සංගක්කාර මයා අතිරේක සර්වේයර් ජනරාල් - | උප සභාපති | අතිරේක සර්වේයර් ජනරාල් ධූරයේ රැඳී සිටින කාලය දක්වා |

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

වර්ෂ 2014 ක් වූ ජුනි මස 06 වැනි දින,
කොළඹ දී ය.

07-170

---

**ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ (සංශෝධිත) 10(3) වගන්තිය යටතේ නිකුත් කෙරෙන නිවේදනය

**බලපත්‍රයකින් නිදහස් කිරීමේ සහතිකය නිකුත් කිරීම**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතෙහි 10(2) වගන්තියෙන් පැවරුණු බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පහත දක්වා ඇති පාර්ශ්වයන් වෙත විදුලිබලය බෙදාහැරීම සඳහා බලපත්‍ර ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කරන බව මෙයින් නිවේදනය කර සිටී.

| *සහතිකපත් අංකය* | *ආයතනය* | *වලංගු කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| EL/EX-D/14/05 | ඇට්ලැන්ටිස් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2014.06.30 | 2019.06.29 |

සභාපති,
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව.

07-28

---

මගේ අංකය ඃ ප්‍ර. නො. 11/2/35/13/2008/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2014.07.04 වෙනි දින සිට 2014.07.18 වෙනි දින දක්වා සතියේ වැඩ කරන දින වල පෙ. ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කමැති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2014.07.25 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී කොට්ඨාසයේ 678 වෙළුමේ 103 පත්ඉරුව. | දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුවේ හික්කඩුවේ පිහිටි "අම්බලමෙවත්ත නොහොත් වලව්වෙ වත්ත", නමැති ගොඩමඩ ඉඩමට බලයලත් මානක එස්. වරුසවිතාන මහතා විසින් 1950.01.09 හා 13 දින මැන සාදන ලද අංක 2130බී දරන පිඹුරේ ලොට් 13 සඳහා මායිම්,<br><br>උතුර : මෙම ඉඩමේ ලොට් 10<br>නැගෙනහිර : මෙම ඉඩමේ ලොට් 14 සහ 15<br>දකුණ : හික්කඩුව බද්දෙගම ප්‍රධාන පාර<br>බස්නාහිර : මෙම ඉඩමේ ලොට් 12 සහ 11<br>ප්‍රමාණය : අ. 0, රූ. 01, පර්. 24.3 | 01. එච්. ඊ. වීරසූරිය ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1995.06.18 දින අංක 3475 දරන තෑගි කරය. |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

07-113

---

**1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත**

1 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ නියමය

1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතේ 1 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය චන්ද්‍රසිරි ගජදීර වන මම මෙම නියමය මගින් මෙහි පහත උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති අධිකරණ කොට්ඨාස සම්බන්ධයෙන් මේ පනතේ II වැනි කොටසේ විධි විධාන ක්‍රියාත්මක විය යුතු දිනය 2013 දෙසැම්බර් මස 01 වැනි දින විය යුතු බව නියම කරමි.

චන්ද්‍රසිරි ගජදීර,
පුනරුත්ථාපන හා බන්ධනාගාර,
ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2014 මැයි මස 29 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

01. මහර අධිකරණ කොට්ඨාසය
02. උඩුගම අධිකරණ කොට්ඨාසය
03. අගුණුකොලපැලැස්ස අධිකරණ කොට්ඨාසය
04. දෙයියන්දර අධිකරණ කොට්ඨාසය
05. පොල්ගහවෙල අධිකරණ කොට්ඨාසය
06. නාඋල අධිකරණ කොට්ඨාසය
07. වලපනේ අධිකරණ කොට්ඨාසය
08. වැල්ලවාය අධිකරණ කොට්ඨාසය
09. බිබිල අධිකරණ කොට්ඨාසය
10. වාලච්චේන අධිකරණ කොට්ඨාසය
11. දෙහිඅත්තකණ්ඩිය අධිකරණ කොට්ඨාසය
12. මුලතිව් අධිකරණ කොට්ඨාසය
13. කිලිනොච්චි අධිකරණ කොට්ඨාසය
14. නිකවැරටිය අධිකරණ කොට්ඨාසය
15. හෙට්ටිපොල අධිකරණ කොට්ඨාසය
16. හිඟුරක්ගොඩ අධිකරණ කොට්ඨාසය
17. මහියංගනය අධිකරණ කොට්ඨාසය
18. සමන්තුරේ අධිකරණ කොට්ඨාසය
19. පොතුවිල් අධිකරණ කොට්ඨාසය
20. කලවංචිකුඩි අධිකරණ කොට්ඨාසය

07-33

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 63009.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ෂයිනින් වීල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2008.02.11 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ෂයිනින් වීල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ෂයිනින් වීල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-56

---

පීවී 82284.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ගෝල්ඩන් ඕවර්සීස් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.11.03 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ගෝල්ඩන් ඕවර්සීස් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ගෝල්ඩන් ඕවර්සීස් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-54

පීවී 82214.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "දික්වැල්ල ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2011.11.01 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "දික්වැල්ල ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "දික්වැල්ල ෆැෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-53

---

පීවී 75025.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "වෝක්වේ (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2010.10.20 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "වෝක්වේ (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "වෝක්වේ (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(*රාජකාරි ඉටුකිරීම*).

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-51

පීවී 77120.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "විජේ ඇන්ඩ් විජේ (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2011.02.10 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "විජේ ඇන්ඩ් විජේ (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "විජේ ඇන්ඩ් විජේ (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
*(රාජකාරී ඉටුකිරීම)*.

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-52

---

පීවී 89821.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "සීකොම් ප්‍රොඩක්ට්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2012.12.11 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සීකොම් ප්‍රොඩක්ට්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සීකොම් ප්‍රොඩක්ට්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
*(රාජකාරී ඉටුකිරීම)*.

2014 ජුනි මස 07 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

07-55

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 මාර්තු 19 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට වවුනියාව ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඇන්ටන් පුනිතනායගම් විසින් ලියා සහතික කරන ලද අංක 1960 හා 2012 පෙබරවාරි මස 06 වන දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, වවුනියාව, "ආර්ටීවයි ස්ටේෂන් වීව්" අංක 40/1 ස්ථානයේ, කුලේන්ද්‍රන් සජේන්ද්‍ර සහ තයාලිනි සජේන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 ජනවාරි 31 වැනි දිනට ඉහත කී කුලේන්ද්‍රන් සජේන්ද්‍ර සහ තයාලිනී සජේන්ද්‍ර යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් අසූ දෙලක්ෂ තිස්හත් දහස් හාරසිය හැට අටකුත් ශත අනූදෙකක (රු.82,37,468.92) මුදලක් සහ 2014 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටතුන් ලක්ෂ අසූහය දහස් දෙසිය හැටනවයකුත් ශත අනූහතක (රු.63,86,269.97) මුදලක් සඳහා සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්ආර්) සියයට අටක (8%) ඉහල අනුපාතිකයක් මත ගණනය කරනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අසූ දෙලක්ෂ තිස්හත් දහස් හාරසිය හැට අටකුත් ශත අනූදෙකක (රු.82,37,468.92) මුදල සහ 2014 පෙබරවාරි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටතුන් ලක්ෂ අසූහය දහස් දෙසිය හැටනවකුත් ශත අනූහතක (රු.63,86,268.97) මුදලක් සඳහා සෑම මාසයකම ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක ණය පොළී අනුපාතිකයට (ඒඩබ්ලිව්පීආර්) සියයට අටක් (8%) ඉහල අනුපාතිකයක් මත ගණනය කරනු ලබන ආසන්නතම ඉහත 0.5% ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1960 දරන උකස් බැඳුම්කරය මගින් එකී කුලේන්ද්‍රන් සජේන්ද්‍ර සහ තයාලිනී සජේන්ද්‍ර යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි ද සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා

සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1960 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

උතුරු පළාතේ, වවුනියාව දිස්ත්‍රික්කයේ, දකුණු වවුනියාවේ, වවුනියාව නගර සභා සීමාව ඇතුළත, දකුණු කිලක්කමූලෙයි හි වයිරවපුලියන්කුලමේ පිහිටි "පලයඩිවලවු" නමැති ඉඩමේ, බලයලත් මානක, කේ. සුබාස් චන්ද්‍රබෝස් විසින් මැන සකස් කළ අංක 20220 හා 2000.03.18 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 05 ලකුණු කළ බෙදා වෙන් කළ හෙක්ටෙයාර් බිංදුවයි දශම එකයි එකයි හතයි එකක් (හෙක්. 0.1171) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටස සහ "පලයඩිවලවු" නමැති ඉඩමේ බලයලත් මානක කේ. කනපතිපිල්ලෙයි මැන සකස් කළ අංක 9426 හා 1994.10.10 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 05 ලෙස ලකුණු කළ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි තුනයි දෙකයි හයක් (හෙක්. 0.01326) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටසෙන් නොබෙදූ 1/2 පංගුවක් එක්ව එම බිම් කොටස් දෙකෙන් තනි ඉඩමක් ලෙස සංයුක්ත වන, බලයලත් මානක එස්. රවීන්ද්‍රනායකම් මැන සකස් කළ අංක 29482 හා 2011.05.05 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 සහ 2 ලෙස නිරූපිත, හෙක්ටෙයාර බිංදුවයි දශම එකයි එකයි හතයි බිංදුවක් (හෙ. 0.1170) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩමෙන් බලයලත් මානක, එස්. රවීන්ද්‍රනායකම් මැන සකස් කළ අංක 29482 හා 2011.05.05 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 02 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටසක් වූ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි අටයි දෙකයි අටක් (හෙ. 0.0828) නොහොත් පර්චස් තිස් දෙකකුත් දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 32.73) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කොටසට මායිම්, උතුරට මෙහි ලොට් අංක 01 සහ කේ. ටී. තිවේන්ද්‍රාගේ දේපළ ද, නැගෙනහිරට කේ. ටී. තිවේන්ද්‍රාගේ දේපළ සහ කණ්ඩිය (Bund) දිගට ඇති රිසවේසම හා අඩි පාර ද, දකුණට - කණ්ඩිය දිගට ඇති රිසවේසම හා අඩිපාර සහ කේ. ඩී. ගුණරත්නම්ගේ දේපළ ද, බස්නාහිරට - කේ. ඩී. ගුණරත්නම්ගේ දේපළ ද,

යන මායිම් ඇතුළත පිහිටි සම්පූර්ණ ඉඩම.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5 ගාලු පාර,
කොළඹ 03.

07-40

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය.

එම්. ඒ. එස්. ප්‍රියන්ත.
ගිණුම් අංක : 0209 5000 1888.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2014 අප්‍රේල් මස 30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක. පී. කිව්. 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. එන් ද සිල්වා යන අය විසින් ලියා සහතික කරන ලද 2012 නොවැම්බර් 28 දාතම හා අංක 842 දරන, 2012 දෙසැම්බර් 17 දාතම හා අංක 878 දරන සහ 2013 ජූනි 13 දාතම හා අංක 1076 දරන උකස් බැඳුම්කර මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනමාල ආරච්චිගේ සුදත් ප්‍රියන්ත යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද එකී අංක 842 හා 878 සහ 1076 දරන බැඳුම්කර ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් අසූ ලක්ෂ විසි නම දහස් නමසිය හැට දෙකයි ශත දහ තුනක (රු.8,029,962.13) මුදලක් 2014 මාර්තු 14 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් අසූ ලක්ෂ විසි නම දහස් නමසිය හැට දෙකයි ශත දහ තුන (රු.8,029,962.13) මුදලද, 2014 මාර්තු 15 වැනි දින සිට අංක 842, 878 සහ 1076 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට ලක්ෂයක (රු.6,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ නමයයි දශම පහක (19.5%) හා තවත් රුපියල් දහ හතර ලක්ෂ හැත්තෑ දෙදහස් තිහයි ශත හැත්තෑ හයක (රු.1,472,030.76) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටයි දශම පහක් (18.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 842, 878 සහ 1076 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණා ලියයුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම පරණකඩේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරණ ගාල්ල - මාතර පාරේ පිහිටි "පුල්ගහවත්ත නොහොත් මාරික්කඳුකොරටුව වත්ත මරතුන් මරික්කන්ගේ වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. ඒ. එම්. හිෂාම් යන අය විසින් සාදන ලද 2004 මැයි 29 දාතම හා අංක 322 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මහගෙදරවත්ත නැගෙනහිරට : කනකපුල්ලේ පදිංචිවහිටියවත්ත නොහොත් කරටටි හවුල්වත්ත සහ බිලිංගහකොරටුව දකුණට : ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර සහ බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් A හි නිර්ණය කළ කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හයයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 26.5) විශාල ඉඩම් කොටස, සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක 322 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව P 18/102 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

07-137

### මහජන බැංකුව - පිටකෝට්ටේ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014.03.28 වන දින පැවැත්වූ එකී අධක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය විසින් සහතික කරන ලද අංක 2957 හා 2007.06.21 දින දරන සහ නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. ආර්. එස්. අබේරත්න මහත්මිය විසින් සහතික කරන ලද අංක 2492 සහ 2010.11.26 වැනි දින දරන උකස් බැඳුම්කර මත අය විය යුතු ගෙවීම් කිරීම ඩික්මන් ඇන්ඩ් චන්ද්‍රා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ විජේසිංහ ආරච්චිගේ ඩික්මන් මහතා සහ චන්ද්‍රලතා ඩයස් අමරදිවාකර වික්‍රමසේකර මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, දැනට එකී අංක 2957 හා 2492 දරන බැඳුම්කර මත රුපියල් දහසය ලක්ෂ අසූ අට දහස් තුන්සිය හතලිස් හතරයි ශත හැට හතක (රු. 1,688,344.67) ක මුදලක් ද, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් ද රුපියල් විසිලක්ෂ අසූ දහස් හයසිය තිස් හතරයි ශත අසූ දෙකක (රු. 2,080,634.82) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දහසය ලක්ෂ අසූ අට දහස් තුන්සිය හතලිස් හතරයි ශත හැට හතක (රු.1,688,344.67) එකී මුදල ද රුපියල් පනස් ලක්ෂයක (රු. 50,00,000) එකී මුදල ද රුපියල් විසි ලක්ෂ අසූ දහස් හයසිය තිස් හතරයි ශත අසූ දෙකක (රු.2,080,634.82) එකී මුදලද 2013.11.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දහසය ලක්ෂ අසූ අට දහස් තුන්සිය හතලිස් හතරයි ශත හැට හතක (රු.1,688,344.67) මුදලක් මත වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් තවදුරටත් පොළිය ද 2014.01.29 වන දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් පනස් ලක්ෂයක (රු.5,000,000) මුදලක් මත වර්ෂයකට සියයට දහ අටයි දශම පහක් (18.5%) බැගින් තව දුරටත් වූ පොළිය ද, 2013.12.02 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් විසි ලක්ෂ අසූ දහස් හයසිය තිස් හතරයි ශත අසූ දෙකක (රු.2,080,634.82) මුදලක් මත වර්ෂයකට සියයට දාහත (17%) බැගින් තව දුරටත් වූ පොළිය විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයවිය යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2957 හා 2492 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ග්‍රාමෝදය මාවතින් ඔබ්බේ මාදිවෙල පිහිටියා වූද, තල්පත්පිටිය පාරෙන් හැරී යන 1 වන පටුමගේ වරිපනම් අංක 47/7C දරන්නාවූ ද, 'අළුබෝගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. අල්විස් විසින් සාදන ලද අංක 2341 සහ 2006.08.03 වැනි දින දරන පිඹුරේ ලොට් "A"ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : එල්. කේ. සිගේරා සහ තවත් අය විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : සී සිගේරා සහ තවත් අයහිමිකම් කියන ඉඩම ද, දකුණට : අංක 1984 දරන පිඹුරේ ලොට් B සහ B2 දරන කොටස් ද, බස්නාහිරට : අංක 48/1993 දරන පිඹුරේ ලොට් A කොටය ද මායිම් වන්නා වූද, එකී අංක 2341 දරන පිඹුරට අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ඉහත කී ලොට් A දරන ඉඩමේ පහත විස්තර කෙරෙන ඉඩමේ නැවත මැනීමකි.

ඉහත කී ග්‍රාමෝදය මාවතින් ඔබ්බේ මාදිවෙල පිහිටියා වූ ද, "අළුබෝගහවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපුගීකියන විසින් සාදන ලද අංක 1043 හා 1986.08.22 වැනි දින දරන පිඹුරේ ලොට් "1" ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූ ද, උතුරට : කේ. එල්. සිගේරා හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : පී. සිගේරා හා තවත් අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ ලොට් අංක 04 ද, බස්නාහිරට : මේ ඉඩමේ ලොට් අංක 2 ද, මායිම් වන්නා වූ ද, එකී අංක 1043 දරන පිඹුරට අනුව පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15.0) විශාල වූ ද, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2985/231 වෙළුමේ /පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත්ය.

පහත දැක්වෙන ඉඩම් කොටස උඩින් මාර්ග ප්‍රවේශ අයිතීන් ද මීට ඇතුළත් වේ.

ඉහත කී ග්‍රාමෝදය මාවතින් ඔබ්බෙහි මාදිවෙල පිහිටියා වූ ද, අළුබෝගහවත්ත යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. එන්. ඒ. අල්විස් විසින් සාදන ලද අංක 2341 හා 2006.08.03 වැනි දින දරන පිඹුරේ ලොට් B (අඩි 10 පළල පාර සඳහා වෙන් කිරීම්) ලෙස ලකුණු කොට ඇත්තා වූ ද, (බලයලත් මිනින්දෝරු කේ. ඒ. කපුගීකියන විසින් සාදන ලද අංක 1043 හා 1986.08.22 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 4 ඉතිරි කොටසේ නැවත මැනීමක් වන්නා වූද, උතුරට : ලොට් A කොටස ද, නැගෙනහිරට : පී. සිගේරා හා තවත් අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : (අඩි 15 ක් පළල) පාර ද, බස්නාහිරට : අංක 1894 දරන පිඹුරේ ලොට් අංක 2B ද, මායිම් වන්නා වූද, එකී අංක 2341 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 1.70) විශාල වූ ද, දෙල්කඳ, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2985/114 වෙළුමේ) පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරි,
(බටහිර කලාප - II)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 177/A හයිලෙවල් පාර,
නුගේගොඩ.

07-107

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය) පී.කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 932080.
මැග් ගුණසේකර ක්‍රියේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2013 ඔක්තෝබර් මස 01 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. පී. හීන්කෙන්ද විසින් 2011 සැප්තැම්බර් මස 21 වැනි දින සහතික කරන ලද අංක 38 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පානදුර දේශසේවා මාවතේ අංක 13 දරන තැන ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකා රජයේ අනපනත්වලට අනුකූලව ස්ථාපිත සමාගමක් වන මැග් ගුණසේකර ක්‍රියේෂන් ප්‍රයිවට් ලිමිටඩ් ණයකරු වශයෙන් ද යොන්මෙරෙන්න සිමන්හේවගේ මංගලිකා ගුණසේකර උකස්කාරිය හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හතලිස්හය ලක්ෂ අසූතුන්දාහස් එකසිය හැත්තෑවයි ශත තිස්හය (රු.24,683,170.36) ක මුදලක් 2013 මැයි මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි හතලිස්හයලක්ෂ අසූතුන්දාහස් එකසිය හැත්තෑවයි ශත තිස්හය (රු.24,683,170.36) ක මුදල අයකර ගැනීම සඳහා සහ 2013 මැයි 31 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් දෙකෝටි දාහත්ලක්ෂ පනස්දාහක 21,750,000 ක මුදල මත 17% ක වැඩිපුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 38 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12 හල්ස්ඩ්‍රෝෆ් වීදියේ තෙවන මහලේ අංක 182 දරන ස්ථානයේ පිහිටි හි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ පානදුර තල්පිට දෙබද්දේ, පානදුර නගර සභා සීමාවේ පට්ටිය හි දේශසේවා මාවතේ වරිපනම් අංක 5, (නව අංක 11D සහ 11D 1 )දරන ගල්කන්දවත්ත නමැති ඉඩමට එහි ඇති සියලු දේ සමග බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් 1998 සැප්තැම්බර් 21 වැනි දින සාදන ලද පිඹුරු අංක 2699 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : මෙහි 2699 දරන පිඹුරේ ලොට් 2, දේශසේවා මාවත නැමති පාර සහ ගල්කන්දවත්ත ද, නැගෙනහිරට : ගල්කන්දවත්ත (රන්කොත් විහාර පරිශ්‍රය) ද, දකුණට : (කලින් එඩ්වින් පීරිස් සහ තවත් අයට අයිති දැනට රන්කොත් විහාර පරිශ්‍රය) වන මෙම ඉඩමේ කොටසක් ද සහ බස්නාහිරට: බලයලත් මිනින්දෝරු යූ. එම්. ද සිල්වා 1964 ජුනි 21 වැනි දින සාදන ලද පිඹුරු අංක 790 හි ලොට් බී සහ සී සහ මතු සඳහන් පිඹුරු අංක 2699 හි සඳහන් ලොට් 3 සහ 2 හි අංක 2699 දරන පිඹුරට අනුව විශාලත්වයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම හත (අ. 0, රූ. 1, පර්. 4.7) වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව F 537/94 යටතේ ලියාපදිංචි වී ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

07-78

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සැම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සැම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | *රු.* | *ශ.* |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සැම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සැම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සැම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 0 | 60 0 |
| III වැනි ඡේදය … … … … … … … | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 0 | 120 0 |
| II වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| III වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 0 | 60 0 |
| V වැනි කොටස … … … … … … … … | 123 0 | 60 0 |
| VI වැනි කොටස … … … … … … … … | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2014** | | | |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2014.08.01 | සිකුරාදා | 2014.07.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.08 | සිකුරාදා | 2014.07.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.15 | සිකුරාදා | 2014.08.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.22 | සිකුරාදා | 2014.08.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.08.29 | සිකුරාදා | 2014.08.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2014.09.05 | සිකුරාදා | 2014.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.12 | සිකුරාදා | 2014.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.19 | සිකුරාදා | 2014.09.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.09.26 | සිකුරාදා | 2014.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.